# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 196 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 03/02/2024 පැය 1445

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

### 01. හෙරෝයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගාල්ල අපරාධ කොට්ඨාසය.

2024.02.02 වන දින අළුයම් කාලයේ දී කොස්ගොඩ පොලිස් වසමේ පාතගම ප්‍රදේශයේදී ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් සහ අහුංගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් වෙත ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරෝයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 ක් , ජංගම දුරකථන 02 ක් හා ගමන් කථන යන්ත්‍රයක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු රත්ගම හා බලපිටිය ප්‍රදේශවල සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ සමීපතමයෙකු බවට අනාවරණය වී ඇත. ගාල්ල අපරාධ කොට්ඨාසය මඟින් වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

### 02. හෙරෝයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.02.02 වන දින රාත්‍රී කාලයේ දී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් වෙත ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරෝයින් ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 545 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - කුට්ටිගල පොලිස් වසම.

2024.02.02 වන දින උදෑසන කාලයේ කුට්ටිගල පොලිස් වසමේ පැල්මඩුල්ල නෝනාගම මාර්ගයේ කුට්ටිගල ප්‍රදේශයේදී නෝනාගම දෙස සිට ඇඹිලිපිටිය දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මාර්ගය හරහා ගමන් ගත් පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පාපැදිකරු පදලංගල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා රත්නපුර රෝහල වෙත ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ තුංකල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල පුද්ගලික බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කුට්ටිගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**